නුඹලා සලාතය ඉටු කරන විට, නුඹලාගේ පේළී කෙළින් සකසා ගන්න. පසුව ඔබ අතරින් කිසිවෙකු හෝ එය මෙහයවීම සඳහා පත් කර ගන්න. ඔහු අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසන විට, නුඹලා ද තක්බීර් පවසන්න

හිත්තාන් ඉබ්නු අබ්දුල්ලාහ් අර්-රකාෂී විසින් වාර්තා කරන ලදී. මම අබූ මූසා අල්-
අෂ්අරී සමග සලාතයක් ඉටු කළෙමි. හෙතෙම වාඩි වී සිටි අවස්ථාවේ එම පිරිස අතරින් මිනිසෙකු: "උපකාරය හා සකාතය සලාතය සමග සම්බන්ධ කෙරී ඇත' යැයි පැවසීය. අබූ මූසා සලාතය නිමා කොට හැරුණු විට, ඔහු: 'ඔබ අතරින් මේ මේ වචන ප්රකාශ කර සිටියේ කවුරුන්දැ?'යි විමසා සිටියේය. පිරිස නිහඬව සිටියේය. පසුව නැවතත් 'ඔබ අතරින් මේ මේ වචන ප්රකාශ කර සිටියේ කවුරුන්දැ?'යි විමසා සිටියේය. එවිටත් පිරිස නිහඬව සිටියේය. ඔහු: 'හිත්තාන් ඔබ වෙන්නැති එය ප්රකාශ කර සිටියේ!!' යැයි පැවසීය. එවිට ඔහු: එමගින් මා අමාරුවේ දමනු ඇතැයි සැබැවින්ම මම බිය වූයෙමි. එවිට එම පිරිස අතරින් මිනිසෙකු: 'එය පවසා සිටියේ මමයි. යහපත මිස වෙන කිසිවක් එමගින් මා බලාපොරොත්තු නොවූයෙමි.' යැයි කීය. එවිට අබූ මූසා: 'නුඹලාගේ සලාතයේදී නුඹලා කුමක් පවසා සිටිය යුතු දැයි නුඹලා නොදන්නෙහු ද? සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් අපට දේශනයක් පවත්වා අපගේ පිළිවෙත් අපට පැහැදිලි කළහ. අපගේ සලාතය අපට ඉගැන්වූහ. එමෙන්ම එතුමාණෝ මෙසේ පවසා සිටියහ.' "නුඹලා සලාතය ඉටු කරන විට, නුඹලාගේ පේළී කෙළින් සකසා ගන්න. පසුව ඔබ අතරින් කිසිවෙකු හෝ එය මෙහයවීම සඳහා පත් කර ගන්න. ඔහු අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසන විට, නුඹලා ද තක්බීර් පවසන්න. ඔහු "ගයිරිල් මග්ලූබි අලයිහිම් වලල්ළාල්ලීන්" (අල්- ෆාතිහා: 7) පැවසූ විට, නුඹලා 'ආමීන්' යැයි පවසන්න. අල්ලාහ් නුඹලාට පිළිතුරු දෙනු ඇත. ඔහු තක්බීර් පවසා රුකූඋ කළ විට නුඹලා ද තක්බීර් පවසා රුකූඋ කරන්න. සැබැවින්ම ඉමාම් නුඹලාට පෙර රුකූඋ කරයි. නුඹලාට පෙර ඉහළට පැමිණෙයි." තවදුරටත් අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) "එය ඒ අයුරින් විය යුත්තකි.' යැයි පැවසූහ. ඔහු 'සමිඅල්ලාහු ලිමන් හමිදා' යැයි පැවසූ විට නුඹලා 'අල්ලාහුම්ම රබ්බනා වලකල් හම්දු' යැයි පවසන්න. නුඹලා වෙනුවෙන් අල්ලාහ් සවන් දෙනු ඇත. සැබැවින්ම තමන්ට ප්රශංසා කරන්නාට අල්ලාහ් සවන් දෙන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මුවින් දන්වා ඇත. ඔහු තක්බීර් පවසා සුජූද් කළ විට නුඹලා ද තක්බීර් පවසා සුජූද් කරන්න. සැබැවින්ම ඉමාම් නුඹලාට පෙර සුජූද් කරයි. නුඹලාට පෙර ඉන් ඉහළට පැමිණෙයි. එවිට අල්ලාහ්ගේ දූතයාණන් එය එමගින්ම විය යුතුය. ඉඳුමෙහි සිටින විට නුඹලා අතරින් කිසිවකු පවසන පළමු ප්රකාශ විය යුත්තේ "අත්-තහිය්යාතුත් තය්යිබාතුස් සලවාතු ලිල්ලාහි, අස්සලාමු අලයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු" යන්නයි. [صحيح] [رواه مسلم]

අබූ මූසා අල්-අෂ්අරී සමග සහාබිවරයකු සලාතයක් ඉටු කළේය. තෂහ්හුද් ඉඳුමෙහි ඔහු සිටිය දී ඔහු පසුපසින් සිට සලාත් ඉටු කරන්නන් අතරින් කෙනෙකු 'අල් කුර්ආනය තුළ උපකාරය හා සකාතය සමග සලාතය සම්බන්ධ කර ඇතැ'යි පවසා සිටියේය. අබූ මූසා (රළියල්ලාහු අන්හු) තුමා සලාතය අවසන් කළ කල්හි මඃමූම්වරුන් දෙසට හැරී 'අල් කුර්ආනය තුළ උපකාරය සහ සකාතය සමග සලාතය සම්බන්ධ කොට